**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2010**
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මතය**
------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**
----------------------------------------

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන ඇතැම් සංඛ්‍යා 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන එම සංඛ්‍යා සමඟ හා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ගිණුම් සමඟ සැසඳිය නොහැකි විය.

(ආ) පහත දැක්වෙන වත්කම් හා බැරකම් වෙන් වශයෙන් ගිණුම්වල දක්වනු වෙනුවට එකිනෙකට හිලව් කර තිබුණි.

  (i) එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අදාල රු.746,760 ක් වූ මුදල් බැර ශේෂයක් හා බැංකු ශේෂ.
  (ii) එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ රු.54,534 ක් වූ හර ශේෂය

(ඇ) 2008 ජූනි 25 සිට 2009 නොවැම්බර් 03 දක්වා රේඛීය අමාත්‍යාංශයට වාහනයක් සමඟ මුදා හැර තිබුණු රියදුරුගේ වැටුප් සහ වාහනයේ අළුත්වැඩියා වියදම් ලෙස මණ්ඩලය විසින් දරා තිබූ රු.648,302 ක මුදල ගිණුම්වල ලැබිය යුතු ලෙස දක්වා නොතිබුණි.

### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ පහකට වැඩි කාලයක සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දැක්වෙන රු.25,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද, එම මුදල් අයකර ගැනීම සැක සහිත වූ බැවින් ඒ සමාන මුදලකින් බොල් හා අඩමාන ණය ප්‍රතිපාදනයක් කර තිබුණි.

(ආ) "CTC" තේ නිෂ්පාදනය සඳහා කම්හල සංවර්ධනය කිරීමට කළුබෝවිටියන "Cut Tear and Curl" (CTC) තේ කම්හලට කිසිදු පොලියක් අය කර ගැනීමෙන් තොරව ණයක් වශයෙන් ලබා දුන් රු.22,465,416 ක මුදල වර්ෂ 15 කට වැඩි කාලයක සිට ලැබිය යුතුව තිබුණි. කෙසේ වුවද, මෙම ණය නිරවුල් කිරීමට පාර්ශ්වයන් දෙක අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) 1995 වර්ෂයේදී තේ මණ්ඩලය විසින් පොල්හේන තේ කම්හලට ලබා දුන් රු.4,329,769 ක මුදල සහනාධාර පිළිබඳ කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් අයකරගත යුතු විය.

(ඈ) කොළඹ තේ වෙන්දේසියේ කොන්දේසි යටතේ දේශීය තේ කර්මාන්තයේ අහිතකර වෙළඳපොල තත්ත්වයන් හේතුවෙන් හා විකුණුම් දිනයට පසුව වන සත්වෙනි දිනය වන විට ගැණම්කරුවන් මිලදී ගැණම් සඳහා ගෙවීම් සම්පූර්ණයෙන් පියවිය යුතු බැවින් 2008 ඔක්තෝබර් 28 දින පැවති කොළඹ තේ වෙන්දේසියේදී මුළු වටිනාකම රු.231,428,831 කට තේ කිලෝ ග්‍රෑම් 916,995 ක් මණ්ඩලය මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, 2011 ජූනි 30 විගණන දිනය දක්වා රු.1,126,520 ක මුදලක් හිඟ හිට පැවති අතර, එම අයවිය යුතු මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) විදුලිය, කුලී, ඉන්ධන, තැපැල්, ගෑස් ආදියට අදාලව එකතුව රු.211,100 ක තැන්පතු අදාල පාර්ශ්වයනගෙන් අය කර ගැනීමෙන් තොරව දීර්ඝ කාලයක සිට ගිණුම්වල පැවතුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 132 වගන්තිය | සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂවලට අදාලව උපයන විට ගෙවීම් බදු සේවකයින්ගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) රජයේ මුදල් රෙගුලාසි | |
| අංක 104 (2) | සමාලෝචිත වර්ෂය තුළදී වාහන අනතුරු 8 ක් සිදු වී තිබුණු අතර, එම වාහන අළුත්වැඩියා සඳහා රු.281,107 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, රෙගුලාසි ප්‍රකාරව එම අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. |
| අංක 757 (2) | රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පොත් ශේෂ, අතිරික්තතා, ඌනතා හෝ නැතිවීම් ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 6.5.1 ජේදය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2011 ජූනි 30 වන විටත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| 5.2.1 ජේදය | සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් අයවැයගත ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අවශ්‍ය පරිදි පිළියෙල කර නොතිබුණි. |
| 5.1.2 ජේදය | සැලසුම් කළ කාල පරිච්ජේදය තුළ අරමුණු සහ ඉලක්ක ඉටු කර ගැනීම සඳහා කළමනාකරුවන්ගේ වගකීම් පැහැදිලිව හඳුනා ගත හැකිවන පරිදි ක්‍රියාකාර සැලැස්මක් සහ සංයුක්ත සැලැස්ම සඳහා කාර්ය සාධන දර්ශකයන් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.29,786,206 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.86,669,272 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.56,883,066 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ සංවර්ධන හා ප්‍රවර්ධනාත්මක වියදම් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

#### 2.1.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) පෙර වර්ෂය හා සැසඳීමේදී සෙස් ආදායම රු.62,400,000 කින් අඩු වී තිබුණි.

(ආ) ගණුදෙනුකරුවන්ගේ බලපත්‍ර ගාස්තු, නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තු , ප්‍රතිකෂේපිත තේ ලියාපදිංචි ගාස්තු , තේ අපනයන සඳහා අළුත් කිරීමේ ගාස්තු, තේ ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම, කම්හල් ලියාපදිංචි ගාස්තු හා විශ්ලේෂණ ගාස්තු අනුපාත ඉහළ යාම හේතුවෙන් රු.33,308,328 කින් වෙනත් ආදායම් වැඩි වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පෞද්ගලික පඩිනඩි රු.21,123,333 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය අවසානයේදී පෝලන්ත ශාඛාව වසා දැමීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

#### 2.1.2 සෙස් රැස් කිරීම

(අ) තේ අංශයේ පර්යේෂණ, මූල්‍ය , නියමු, අලෙවි සංවර්ධන හා ප්‍රවර්ධන කටයුතු කරගෙන යාම සඳහා මූල්‍යයනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් කෙරෙන සියළුම තේ අපනයනයන්ට සෙස් බද්දක් පනවා ඇත. කිලෝ ග්‍රෑමයකට නියම කර තිබුණු රු.2 ක් වූ සෙස් බද්ද 1997 අප්‍රේල් සිට බල පැවැත්වෙන පරිදි රු.2.50 දක්වා වැඩි කර තිබුණි. 2006 අප්‍රේල් 18 සිට බලපැවැත්වෙන පරිදි එම සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රු.4.00 දක්වා තවදුරටත් වැඩි කර තිබුණි. එයට අදාල ගැසට් නිවේදනය ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ අනමැතිය සහිතව 2006 අප්‍රේල් 17 දිනැති අංක 1441/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබුණි.

සෙස් අරමුදලට අදාල මෙහෙයුම් පිළිබඳව වූ එකම ආඥා පනත වන 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 13 සහ 14 වගන්තිවල විධිවිධානවලට අනුකූලව සෙස් අරමුදල පිහිටුවීම හා මෙහෙයවීම සිදු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රේගුව විසින් රැස් කරන ලද මළු සෙස් ප්‍රමාණයෙන් 16% ක් වූ රු. මිලියන 192.0 ක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට නියාමන, ප්‍රවර්ධනය හා වෙනත් සහාය කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි.

(ඇ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු සෙස් ආදායම රු. මිලියන 62.4 කින් එනම්, 24.5% කින් අඩු වී තිබුණි.

## 2.2 හඳුනා ගන්නා ලද පාඩු

පහත දැක්වෙන පාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු.40,340 ක් වූ ඇප තැන්පතු වර්ෂ 20 කට වැඩි කාලයක් ගිණුම්වල පැවතීම නිසා ලාභයට එරෙහිව අය කර තිබුණි.

(ආ) මිය යාම, සේවය අත්හැර යාම ආදී කරුණු හේතුවෙන් සේවකයන් පස් දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.219,814 ක් වූ සේවක ණය ලාභයට එරෙහිව අයකර තිබුණි.

## 2.3 කාර්ය සාධන සමාලෝචනය

### 2.3.1 මණ්ඩලයේ කටයුතු

මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ කටයුතු ක්‍රමවත් කිරීම, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි "ලංකා තේ" අලෙවිකරණය හා ප්‍රවර්ධනය, තේ පිළිබඳ වෙළඳපොල පර්යේෂණ හා තේ කර්මාන්තය සඳහා වෙළඳපොල තොරතුරු සැපයීම තේ කොමසාරිස් අංශය, තේ අපනයන අංශය, තේ ප්‍රවර්ධන අංශය, විශ්ලේෂණාත්මක රසායනාගාරය සහ තේ පරීක්ෂා කිරීමේ ඒකකය, මගින් තේ වෙළඳාමට අවශ්‍ය රසායනාගාර හා කාර්මික සේවා සැපයීමය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, කාර්යයන් කිහිපයක් සඳහා මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| ව්‍යාපෘතිය / වැඩසටහන | 2010 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් | |
|---|---|---|
| | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| | % | % |
| තේ කම්හල්වල ගුණාත්මක පද්ධති සවි කිරීම | 80 | 10 |
| කම්හල් නවීකරණය හා නැවත වගා කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රම | 98 | 21 |

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන | 33 | 16 |
| ඒක ජාතික ප්‍රවර්ධනයන් | 35 | 8 |
| දේශීය ප්‍රවර්ධනයන් | 43 | 12 |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | 100 | 6 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 47 | 5 |
| ලී බඩු හා උපකරණ | 50 | 12 |

ඉහත තොරතුරුවලට අනුව, මූල්‍ය හා භෞතික ප්‍රගතිය අතර සැලකිය යුතු විචලනයන් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.3.2 ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය

මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යා ලේඛනවලට අනුව, 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තේ නිෂ්පාදනය පිළිබඳ වර්ගීකරණයක් පහත දැක්වේ.

| උන්නතාංශය | තේ නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | | | 2008 වර්ෂය සමඟ සැසඳීමේදී වැඩි වීමේ / (අඩුවීමේ) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2010 | 2009 | 2008 | |
| උස් බිම්වල වැවෙන | 78,388 | 72,480 | 83,662 | (6.3) |
| මධ්‍ය බිම්වල වැවෙන | 54,060 | 43,313 | 47,024 | 14.9 |
| පහත් බිම්වල වැවෙන | 198,668 | 173,033 | 184,691 | 5.9 |
| | 328,116 | 288,826 | 315,377 | 4.0 |
| හරිත තේ නිෂ්පාදනය | 3,310 | 2,305 | 3,039 | 8.9 |
| මුළු තේ නිෂ්පාදනය | 331,426 | 291,131 | 318,416 | 4.0 |

පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 40,295 කින් එනම්, 21% කින් වැඩි වී තිබුණි.

### 2.3.3 ශ්‍රී ලංකාවේ තේ අපනයනය

විගණනයට ලබා ගත හැකි වූ සංඛ්‍යා ලේඛන අනුව, 2008 වර්ෂයේ සිට 2010 දක්වා ශ්‍රී ලංකාවේ තේ අපනයනය පහත දැක්වේ.

| වර්ගය | තේ අපනයනය (මිලියන කි. ග්‍රෑම්) | | | 2008 වර්ෂය සමඟ සැසඳීමේදී වැඩි වීමේ / අඩු වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2010 | 2009 | 2008 | |
| තොග තේ | 161.1 | 164.5 | 178.0 | (9.5) |
| තේ පැකට් | 82.0 | 75.5 | 84.3 | (2.7) |
| තේ බෑග් | 23.1 | 18.7 | 20.3 | 13.8 |
| ක්ෂණික තේ | 1.3 | 1.4 | 1.3 | - |
| හරිත තේ | 5.0 | 3.9 | 3.9 | 28.2 |
| වෙනත් තේ | 26.0 | 15.9 | 13.4 | 94.0 |
| එකතුව | 298.5 | 279.9 | 301.2 | (0.9) |

පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ තේ අපනයනය මිලියන කි.ග්‍රෑම් 18.6 කින් එනම්, 7% කින් වැඩි වී තිබුණි. තොග තේ අපනයන ප්‍රමාණය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී අඩු වී තිබුණි. 2008 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලොචිත වරෂයේ අපනයන ප්‍රමාණය 0.9% කින් අඩුවී තිබුණි.

### 2.3.4 තේ පර්යේෂණ, සංවර්ධනය හා ප්‍රවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම

මූල්‍ය ප්‍රකාශනවලට අනුව, තේ සංවර්ධන කටයුතු, ප්‍රවර්ධන කටයුතු සහ පර්යේෂණ හා සංවර්ධනය සඳහා මණ්ඩලය විසින් 2008 සිට 2010 වර්ෂය දක්වා දරන ලද වියදම පහත දැක්වේ.

| වර්ෂය | සංවර්ධන කටයුතු | ප්‍රවර්ධන කටයුතු | පර්යේෂණ හා සංවර්ධනය | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 2008 | 3,644,246 | 109,358,718 | 1,829,850 | 114,832,814 |
| 2009 | 24,552,506 | 102,286,182 | 2,003,148 | 128,841,836 |
| 2010 | 10,394,094 | 58,843,391 | 2,551,662 | 71,789,147 |
| | 38,590,846 | 270,488,291 | 6,384,660 | 315,463,797 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංවර්ධන කටයුතු, තේ පර්යේෂණ හා සංවර්ධන සහ ප්‍රවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී රු.57,052,689 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී කම්හල් නවීකරණ සඳහා සහනාධාර සඳහා ඉල්ලුම් කර තිබුණු කම්හල් 244 කින් කම්හල් 13 කට පමණක් එකතුව රු.8,820,997 ක් වූ සහනාධාර ලබා දී තිබුණි. එබැවින් සහනාධාර ලබා දීමේ ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය. සහනාධාර යෝජනා ක්‍රමයේ කොන්දේසි කඩකර මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව 2009 වර්ෂයේදී යන්ත්‍රෝපකරණ සවි කරන ලද කම්හලකට එකතුව රු.1,000,000 ක් වූ සහනාධාර ලබා දී තිබුණි. කෙසේ වුවද, රු.1,000,000 ක් වූ සහනාධාරවලින් රු.750,000 ක් කම්හල විසින් 2011 ජූනි 30 දක්වා ආපසු ගෙවා තිබුණි.

(ඇ) ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන වියදම් හා ඒක ජාතක ප්‍රවර්ධන කටයුතු පෙර වර්ෂය සමඟ සැසඳීමේදී රු.40,384,109 කින් අඩු වී තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

කාර්ය මණ්ඩල පිරිවැය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 72 | 57 | 15 |
| ලිපිකරු සහ වෙනත් ශ්‍රේණි | 137 | 113 | 24 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 74 | 68 | 06 |
| එකතුව | 283 | 238 | 45 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ආ) වගන්තියට අනුකූලව අනුමත කරන ලද සංවිධාන සටහනක් හා සේවක සංඛ්‍යාවක් මණ්ඩලයේ නොවීය. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවකයින් 250 ක ගෙන් හා රැකියා විරහිත උපාධිධාරී යෝජනා ක්‍රමය යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවකයින් 33 ක ගෙන් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව සමන්විත විය.

(ආ) චක්‍රලේඛයේ 9.3.1 වගන්තියේ දක්වා ඇති පරිදි බඳවා ගැනීම් හා උසස් වීම් සඳහා විධිමත් යෝජනා ක්‍රමයක් මණ්ඩලය විසින් අනුගමනය කර නොතිබුණි.

(ඇ) 2007 ජූනි මස සිට පුරප්පාඩු වී පැවති ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර ඇතුළත් තනතුරු 45 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා නව යෝජනා ක්‍රමයක් හා කාර්ය මණ්ඩල සංශෝධනයක් ක්‍රමවත්ව සකස් කිරීම සඳහා 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට රු.680,000 ක් ගෙවා තිබුණද, 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව නව බඳවා ගැනීම් හා උසස් කිරීම් යෝජනා ක්‍රමය හා කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම මේ වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන කාර්යයන් ඵලදායීව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් පත් කර / අනුයුක්ත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 2.5 සේවක නිවාස ණය යෝජනා ක්‍රමය

--------------------------------------

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (රා උ ආ බැ) සමඟ සහයෝගයෙන් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සේවක නිවාස ණය යෝජනා ක්‍රමය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය 2011 මැයි 31 වන විටත් ලබා ගෙන නොතිබුණි. 2009 හා 2010 වර්ෂවලදී සේවකයන් වෙනුවෙන් ඇතැම් නිවාස ණය සඳහා මණ්ඩලය විසින් ඉතා ඉහළ පොලී අනුපාත ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබුණු සනාථ කිරීමට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට ආයෝජන ශේෂය රු.16,142,969 ක් වූ අතර, ශේෂ පත්‍රයට අනුව එය රු.13,377,908 ක් විය. රු.2,824,557 ක් වූ වෙනස බැංකු සනාථ කිරීමට අනුව ලැබී තිබුණද, ගිණුම්වල ලැබිය යුතු පොලී ලෙස එය දක්වා තිබුණි.

(ඇ) ණය ලබා දීම සඳහා මණ්ඩලයේ අරමුදල් උපයෝජනය කර තිබුණද, පැරණි ණය පිළිබඳව ණය ලේඛන ඇතුළත් ප්‍රමාණවත් වාර්තා මණ්ඩලය විසින් විධිමත්ව පවත්වා නොතිබුණි. එබැවින් මුළු ආයෝජනයම ණය ලබා දීම සඳහ උපයෝජනය කර

තිබුණේද යන්න හා ණය නියමිත පරිදි අයකරගෙන තිබුණේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට රු.9,592,293 ක්වූ මුළු ණය ශේෂය හා රු.6,550,549 ක් වූ තැන්පතු ශේෂය අඩු පොලී අනුපාතයක් යටතේ බැංකුවේ අනවශ්‍ය පරිදි රඳවා තබා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.6 වත්කම් කළමනාකරණය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසන් පරිහරණය කරන ලද ගොඩනැගිල්ල 2002 දෙසැම්බර් 31 දින අත්හරින ලද අතර, පරිශ්‍රයේ අයිතිකරු වෙත තැන්පත් කරන ලද රු.2,400,000 ක කුලී තැන්පතුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද, මෙම කාරණය සඳහා තීරකවරයෙක් පත් කර තිබුණු බවත්, මේ සම්බන්ධයෙන 2005 වර්ෂයේ සිට 2011 මැයි 30 දක්වා රු.2,134,514 ක මුදලක් වැය කර තිබුණු බවත්, විගණනයේදී නිරීක්ෂණය විය. වර්ෂ 04 ක් ගතවීමෙන් පසුව 2009 වර්ෂයේදී බේරුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් වී තිබුණද, තීරණයට අනුව, ගොඩනැගිල්ලට සිදු වූ හානිය හා අළුත්වැඩියා හැර රු.1,816,214 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතු විය. එහෙත්, පරිශ්‍රයේ අයිතිකරු විසින් තීරකවරයාගේ තීන්දුවට එරෙහිව මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණු අතර, 2008 ඔක්තෝබර් මාසයේදී මෙම කාරණය සඳහා නව තීරකවරයෙක් පත් කර තිබුණි. මෙම කාරණය තීන්දුවක් අපේක්ෂාවෙන් තවමත් පවතී.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශයේ කටයුතුවලට සහාය වීම සඳහා "Specialized Application" මෘදුකාංග හා ආශ්‍රිත දෘඩාංග සපයා සවි කිරීමට මණ්ඩලය විසින් 2009 දෙසැම්බර් 31 දක්වා පෞද්ගලික ආයතනයකට රු.9,038,930 ක මුදලක් ගෙවා තිබුණි. 2005 අප්‍රේල් 07 දින එළඹි ගිවිසුම ප්‍රකාරව මෙම ජාල පද්ධතිය සවිකර භාර දීම සඳහා දින 90 ක් තුළ නිම කරීමට සැලසුම් කර තිබුණද, දෙපාර්ශවයේම අඩුපාඩු හේතුවෙන්, නිම කිරීමේ කාලය 2008 අප්‍රේල් 01 දින දක්වා අන්‍යොන්‍ය එකඟතාවය මත දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2010 දෙසැම්බර් 31 වන විටත් මෙම කාර්යය සම්පූර්ණ නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්වල දක්වා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වය. තවද, ගිවිසුමේ 3 පරිශිෂ්ඨයෙහි 5 වගන්තිය ප්‍රකාරව ප්‍රමාණ කළ අලාභ අයකර ගෙන නොතිබුණි

(ඇ) කැනඩා සහ බැංකොක් තානාපති කාර්යාලවල ජංගම ගිණුම්වල එකතුව රු.317,231 ක මුදලක් සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට නිෂ්කාර්යව පැවතුණි

## 2.7 ආයෝජන

-----------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.60,358,186 ක් වූ පාර්තෝෂික ප්‍රතිපාදන හා අමු තේ දළු බෙදා හරින්නන්ගේ තැන්පතු ආයෝජනයෙන් රු.24,143,274 ක මුදලක් (ආයෝජනයෙන් 40% ක්) 2010 සැප්තැම්බර් 28 දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2010 වර්ෂය තුළදී ඒකාබද්ධ අරමුදලට මණ්ඩලයේ අතිරික්ත අරමුදල් ලෙස ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වුවද, මෙම ආයෝජන අතිරික්ත අරමුදල් නොවූ බවත්, අමු තේ දළු සපයන්නන් ඉල්ලීම් කළ විට හා පාර්තෝෂික අවශ්‍යතා ඇති වූ විට වහාම ලැබිය යුතු බවත්, නිරීක්ෂණය විය. ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ආ) ලංකා බැංකු ලන්ඩන් ශාඛාවේ මාස 06 ක ස්ථාවර තැන්පතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පොළී රු.902,719 ක් ලැබී තිබුණද, ස්ටර්ලිං පවුම් විනිමය අනුපාතය පහළ වැටීම හේතුවෙන් සදු වී තිබූ රු.3,896,073 ක පාඩුව සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව අයකර තිබුණි.

## 2.8 තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා බදු

----------------------------------------------------

2010 ඔක්තෝබර් 27 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනයට අනුව, තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා බදු රැස් කිරීමක ලෙස එක් එක් තේ අපනයනයකදී (කිලෝ ග්‍රෑමයකට රු.3.50 බැගින්) තේ අපනයනකරුවන්ගෙන් 2010 නොවැම්බර් 01 දින සිට එකතුව රු.194,275,470 ක මුදලක් 2010 වර්ෂය සඳහා රැස් කර තිබුණි. ශ්‍රී ලංකාව ඇතුළත හා පිටත තේ ප්‍රවර්ධන හා අලෙවි උපාය මාර්ගවලට අදාල කටයුතුවලට යොදා ගැනීම මෙම රැස් කිරීමේ අරමුණ විය. කෙසේ වුවද, මුළු රැස් කිරීම රු.524,958,409 ක් වී තිබුණු නමුත්, 2011 ජූනි 30 දක්වා කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි. ගැසට් නිවේදනයේ 04 ජේදයට අනුව, රැස් කරන ලද මදල මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලේ කොටසක් ලෙස තීරණය කළ යුතුය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, තේ ප්‍රවර්ධන හා අලෙවි බදු මත තැන්පතුවක් ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

## 2.9 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැය සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණ වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

(ඈ) සහනාධාර ගෙවීම්

(ඉ) සේවක ණය